වේලනෙයි ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 17 දින සභාවේ ලේකම්ට වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වේලනෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් ප්‍රයෝජනයට ගනුලබන වාහන 12 ක වටිනාකම තක්සේරුකර අවසන් ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් මොටර් වාහන සහ කරත්ත වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සභාවට අයිතිය පවරාගෙන නොමැති, ප්‍රයෝජනයට ගනිමින් පවතින වාහන 31 ක් රු.18,215,636 කට වටිනාකම තක්සේරු කර අවසන් ගිණුම්වලට ගෙනවිත් තිබීමෙන් මොටර් වාහන හා කරත්තවල වටිනාකම රු. 18,215,636 කින් ගිණුම්ල වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
----------------------------------------

සභාව විසින් හානි පාඩු ලේඛනය, ණය හිමි ලේඛනය, විථි ලාම්පු ලේඛනය, මිනුම්පත්‍ර ලේඛනය, ඉඩම් විකුණුම් ලේඛනය යනාදි ලේඛන පවත්වා නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් නිලධාරියෙකුගෙන් අයවියයුතු රු. 35,295 ක මුදල වර්ෂ දහයකට වඩා වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(ආ) (i) 2015 වර්ෂයේ සිට තැන්පත් කර තිබූ නොගෙවූ වැටුප් රු. 29,335 ක් වාර්තා දිනය දක්වා අදාල අය වෙත ගෙවා නොතිබුණි.

(ii) නිලධාරියෙකුට ගෙවිය යුතු වැටුප් රු. 14,644 ක් 2005 වර්ෂයේ සිට ගෙවා නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය සාක්ෂි නොමැතිවීම හේතුවෙන් රු. 153,738 ක් වටිනා ගනුදෙනු 04 ක් පිළිබඳ විගණනයේදී සතුටුදායකව සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අංක 148(1) | වාහන සහ සතුන් සම්බන්ධයෙන් බදු පැනවීමට ප්‍රදේශීය සභාවට බලය පවරා තිබුණද, එම වාහන සහ සතුන් සඳහා නියමිත බදු ප්‍රතිශතයක් අයකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 381(3) | චෙක්පත්වල අත්සන් කිරීම සඳහා බලය ලබා ඇති නිලධාරින් ඇප මුදල් ගෙවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | රු. 67,004 ක කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | අදාල මාසයේ වාහනවල ධාවන සටහන් ඊලඟ මාසයේ 15 වන දිනට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1990 ඔක්තෝබර් 10 වන දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සභාව සතු වාහනවලට ඉන්ධන පාරිභෝජනය පිළිබඳ පරීක්ෂණ පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 11,181,818 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 9,235,424 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු. 1,946,394 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්ත රු. 42,198 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 1,046,683 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රතිඵලය රු. 1,004,485 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

--------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 38,906,074 ක් වි තිබූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 29,822,929 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 9,083,145 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය

------------------------

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

--------------------------------------

ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016<br>ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 797 | 711 | - |
| බදු කුලී | 1,418 | 1,385 | 150 |
| බලපත්‍ර ගාස්තු | 245 | 314 | - |
| වෙනත් ආදායම් | 36,434 | 42,870 | - |
| එකතුව | 38,894 | 45,280 | 150 |

2.4.2 වරිපනම් බදු

--------------

සභා බලප්‍රදේශයේ දේපල වලින් වරිපනම්බදු අද දක්වා අයකර නොතිබුණි.

2.4.3 බදු හා කුලි

-------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 116,233 ක්වූ හිඟ බදු මුදල් මේ දක්වා අයකර නොතිබුණි.

(ආ) රු. 9,225 ක හිඟ කුලි මේදක්වා අයකර නොතිබුණි.

2.4.4 බලපත්‍ර ගාස්තු

----------------

සභා බලප්‍රදේශයේ ස්ථාපිතකර තිබූ සන්නිවේදන කුළුනු 10 ක් සඳහා ඉදිකිරීමට අවශ්‍ය අවසර, වාර්ෂික බදු ලබාගෙන නොතිබුණි.

2.4.5 මුද්දර ගාස්තු

---------------

ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් ලබාගතයුතු රු. 17,296,312 ක් වටිනා මුද්දර ගාස්තු මෙතෙක් ලබාගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සිට සාට්ටි ලිඳ මාර්ගය වෙනුවෙන් ගෙවීම් කරන ලද රු. 331,935 අදාල අවශ්‍යතාවය සඳහා යොදවා ගෙන නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් සභාවේ දායක මුදල රු. 168,158 ක් අදාල අයට ගෙවා නොතිබුණි.

(ඇ) ප්‍රජා මධ්‍යස්ථානය සඳහා ලැබී තිබූ පරිත්‍යාග රු. 257,400 අදාල ප්‍රජා මධ්‍යස්ථානවලට ගෙවා නොතිබුණි.

(ඈ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 84 ක්වුවද, තත්‍ය සේවක සංඛ්‍යාව 66 ක් බැවින් සේවක සංඛ්‍යාවේ ඌනතාවය 18 කි.

(ඉ) සභාව සතුව සුසාන භූමි 13 ක් තිබුණද, ඒවායින් බදු අයකර නොතිබුණි.

(ඊ) සභාවේ උපකාර්යාලය සහ පුස්තකාලවල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී වර්ග 46 ක භාණ්ඩ 578 ක ඌනතාවයක් පැවතුණි.

3.2 ඌන උපයෝජිත වත්කම්

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාහන පිරිසිදු කරන ස්ථාන, නවීන උපකරණ සමඟ උද්‍යානය, තුලෙයිඌර් මාළු වෙළඳ පොල, මුත්තවෙලි පොළ සංකීර්ණය, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය යන මැතකදී ඉදිකරන ලද වත්කම් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) සභාව සතු වාහන 16 නිෂ්ක්‍රිය තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 09 ක් සභාව විසින් සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

3.4 ප්‍රමාදවූ ව්‍යාපෘති

---------------------

සමාලෝචිත වර්ෂයේදී රු. 1,300,000 ක් වටිනා ප්‍රාග්ධන වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.5 අපද්‍රව්‍ය කළමනාකරණ

-------------------------

අපද්‍රව්‍ය එක් රැස්කර ගොඩගසා තිබුණද, වර්ගීකරණය කර නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
-----------------

වියදම් ව්‍යුහය
---------------

අයවැයගත වියදම් සහ සත්‍ය වියදම් අතර රු. 61,000 සිට රු. 1,517,264 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.